# ත්‍රස්තවාදී ක්‍රියා හානි රක්ෂණය - රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය

**ඔප්පු වර්ගය:** භෞතික අලාභ හෝ භෞතික හානි, කැරලි කෝලාහල, වැඩවර්ජන, සිවිල් කැලඹීම්, ද්වේෂසහගත හානි, ත්‍රස්තවාදය සහ කඩාකප්පල්කාරී ක්‍රියා සඳහා ආරක්ෂාව ලබාදෙන රක්ෂණයකි

**ලබා දෙනු ලබන මූලික ආවරණය:**

මෙම රක්ෂණය ඔප්පු කාලසීමාව තුළදී පහත දක්වා ඇති පරිදි ලැයිස්තුගත උවදුරක් හේතුවෙන් සිදුවන සෘජු භෞතික අලාභයකට හෝ හානියකට එරෙහිව ස්පර්ශ කළ හැකි දේපල ආවරණය කරයි:

- සිවිල් කැලඹීම්
- කැරලි කෝලාහල
- ද්වේෂසහගත හානි
- කඩාකප්පල්කාරී ක්‍රියා
- වැඩවර්ජන
- ත්‍රස්තවාදී ක්‍රියා

*(මූලික ආවරණය පිළිබඳ වැඩි විස්තර සඳහා, කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 01 බලන්න)*

**දීර්ඝ කිරීම් (අමතර වාරිකයක් ගෙවා මෙම අමතර ආවරණය ලබා ගත හැකිය):**

- ව්‍යාපාර ඇණහිටීම්

*(දීර්ඝ කිරීම් පිළිබඳ වැඩි විස්තර සඳහා, කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 11 බලන්න)*

**විධිවිධාන:**

මෙම ඔප්පුව යටතේ එක් සිදුවීමක් සඳහා හා සමස්ථ වශයෙන් ගෙවිය යුතු මුලු මුදල අවදානම් විස්තරවල දක්වා ඇති මුළු රක්ෂිත මුදල නොඉක්මවනු ඇත.

*(වැඩි විස්තර සඳහා, කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 05 "රක්ෂිත මුදල" කොටස බලන්න)*

**ආවරණය නොවන දේ (පොදු ව්‍යතිරේක):**

**ද්‍රව්‍යමය හානි ව්‍යතිරේක**

1. න්‍යෂ්ටික පිපිරීම, න්‍යෂ්ටික ප්‍රතික්‍රියාව, න්‍යෂ්ටික විකිරණ හෝ විකිරණශීලී දූෂණයෙන් සෘජුව හෝ වක්‍රව සිදුවන අලාභය හෝ හානිය, එවැනි න්‍යෂ්ටික පිපිරීම, න්‍යෂ්ටික ප්‍රතික්‍රියාව, න්‍යෂ්ටික විකිරණ හෝ විකිරණශීලී දූෂණය කෙසේ හෝ සිදුවී තිබිය හැකිය.
2. යුද්ධය, ආක්‍රමණය හෝ යුධමය මෙහෙයුම් (යුද්ධයක් ප්‍රකාශ කර තිබුණත් නැතත්), ස්වෛරී හෝ පලාත් පාලන ආයතනවල සතුරු ක්‍රියා, සිවිල් යුද්ධය, කැරැල්ල්, විප්ලවය, කැරලි කෝලාහල, යුධ නීතිය හෝ බලය අත්පත් කර ගැනීම මගින් සෘජුව හෝ වක්‍රව සිදුවන අලාභය හෝ හානිය.
3. ලැයිස්තුලත උවදුරක් නිසා භෞතික අලාභයක් හෝ හානියක් සෘජුවම සිදුවුවහොත් මිස, අත්පත් කර ගැනීම හෝ නීත්‍යානුකූල හෝ නීති විරෝධී ඊකියාවකින් සිදුවන පාඩුව.

**People's Insurance PLC,** No. 07, Havelock Road, P.O. Box 215, Colombo 05.
Tel: +94 11-2126 126 | Fax: +94 11-2126 109 | E-mail: pilassist@plc.lk | www.peoplesinsurance.lk
(A Subsidiary of People's Leasing & Finance PLC and People's Bank) - Company No. PB 3754 PQ



4. රාජසන්තක කිරීම, ජනසතු කිරීම, අත්පත්කර ගැනීම, රඳවා තබා ගැනීම, සම්බාධක පැනවීම, නිරෝධායනය කිරීම හෝ රක්ෂිතයාට තම දේපල භාවිතය හෝ වටිනාකම අහිමි කරන මහජන හෝ රජයේ හෝ අධිකාරියේ නියෝගයක ප්‍රතිඵලයක් ලෙස සිදුවන අලාභය හෝ හානිය, නීති විරෝධී භාණ්ඩ හෝ නීති විරෝධී ප්‍රවාහනය හෝ නීති විරෝධී වෙළෙඳාම හේතුවෙන් සිදුවන අලාභය හෝ හානිය.
5. දූෂක හෝ අහිතකර ද්‍රව්‍ය කාන්දුවීම, පිටවීම හෝ පැතිරීම හේතුවෙන් සෘජුව හෝ වක්‍රව ඇතිවන අලාභ හෝ හානි සඳහා මෙම රක්ෂණයෙන් ආවරණය ලබා නොදේ.මෙම දූෂක හෝ අහිතකර ද්‍රව්‍ය ලෙස ඝන, ද්‍රව, වායුමය හෝ උෂ්ණත්වමය ලෙස බලපාන දූෂිත, විෂ සහිත හෝ අනතුරුදායක ද්‍රව්‍ය ඇතුළත් වන අතර, මිනිසුන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව, සුබසාධනය හෝ පරිසරයට අනතුරක් ඇති කරන හෝ එවැනි අනතුරක් ඇති කිරීමට හැකි ඕනෑම ද්‍රව්‍යයක්ද මෙයට අයත් වේ.
6. රසායනික හෝ ජීව විද්‍යාත්මක විමෝචනය, මුදාහැරීම, විසර්ජනය, විසුරුවා හැරීම හෝ ගැලවී යාම හෝ රසායනික හෝ ජීව විද්‍යාත්මක නිරාවරණය හේතුවෙන් සෘජුව හෝ වක්‍රව සිදුවන අලාභය හෝ හානිය.
7. ඕනෑම ආකාරයක ඇස්බෙස්ටෝස් විමෝචනය, මුදාහැරීම, විසර්ජනය, විසුරුවා හැරීම හෝ ගැලවී යාම හෝ ඇස්බෙස්ටෝස් නිරාවරණය හේතුවෙන් සෘජුව හෝ වක්‍රව ඇතිවන අලාභය හෝ හානිය.
8. රක්ෂිතයා විසින් දරනු ලබන හෝ ඕනෑම අධිකරණයක්, රජයේ ආයතනයක්, මහජන හෝ සිවිල් අධිකාරියක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු විසින් පනවනු ලබන ඕනෑම දඩයක් හෝ වෙනත් තක්සේරුවක්.
9. පරිගණක හැක් කිරීම හෝ ඕනෑම ආකාරයක පරිගණක වෛරස් හඳුන්වා දීම, හෝ දූෂිත හෝ අනවසර උපදෙස් හෝ කේතයක් හඳුන්වා දීම, හෝ ඕනෑම විද්‍යුත් චුම්භක අවියක් භාවිතා කිරීම ඇතුලුව නමුත් ඒවාට පමණක් සීමා නොවන ඉලෙක්ට්‍රොනික ක්‍රම මගින් සිදුවන අලාභය හෝ හානිය.
   ඕනෑම පරිගණකයක් පරිගණක පද්ධතියක් හෝ පරිගණක මෘදුකාංග වැඩසටහනක් හෝ ඕනෑම ආයුධයක හෝ මිසයිලයක දියත් කිරීමේ සහ හෝ මාර්ගෝපදේශක පද්ධතියේ සහ/හෝ වෙඩි තැබීමේ යාන්ත්‍රණයේ වෙනත් ඕනෑම ඉලෙක්ට්‍රොනික පද්ධතියක් භාවිතා කිරීමෙන් ඇතිවන පාඩු (මෙම රක්ෂණය යටතේ වෙනත් ආකාරයකින් ආවරණය වන) බැහැර කිරීමට මෙම ව්‍යතිරේකය ක්‍රියාත්මක නොවේ.
10. මේ යටතේ රක්ෂණය කර ඇති ඕනෑම දේපලක් ප්‍රතිසංස්කරණය කිරීම, අලුත්වැඩියා කිරීම හෝ කඩා දැමීම නියාමනය කරන ඕනෑම ආඥා පනතක් හෝ නීතියක් ඕනෑම මහජන හෝ රජයක් හෝ ප්‍රාදේශීය හෝ සිවිල් අධිකාරියක් විසින් බලාත්මක කිරීම මගින් සිදුවන පාඩුව හෝ වැඩි පිරිවැය.
11. සත්‍ය හෝ විභව ලැයිස්තුගත අනතුරක් වැළැක්වීමට පියවර ගැනීමට පෙර ප්‍රතිරක්ෂකයා විසින් ලිඛිතව එකඟ නොවන්නේ නම් එවැනි මර්දනය කිරීමට හෝ පාලනය කිරීමට ගත් පියවර නිසා සිදුවන අලාභය හෝ හානිය.
12. ඕනෑම අනුෂංගික අලාභයක් හෝ හානියක්, භාවිතය අහිමි වීමක්, වෙළඳපොල ප්‍රමාදයක් හෝ අලාභයක්, ආදායම් අහිමි වීමක්, ක්ෂයවීමක්, ක්‍රියාකාරීත්වයේ අඩුවීමක් හෝ වැඩ කිරීමේ පිරිවැය වැඩිවීමක්.
13. ජලය, ගෑස් හෝ විදුලි සැපයුම් සහ විදුලි සංදේශ හෝ ඕනෑම ආකාරයක සේවාවක් නැවැත්වීම, උච්චාවචනය වීම හෝ වෙනස් වීම හෝ ප්‍රමාණවත් නොවීම ඇතුලු සාධක නිසා සිදුවන අලාභය හෝ හානිය.
14. තර්ජනයක් හෝ ප්‍රෝඩාවක් හේතුවෙන් සිදුවන අලාභය හෝ පිරිවැය වැඩිවීම.
15. සොරකම්, ගෙවල් බිඳීම්, කොල්ලකෑම්, සොරකම් හේතුවෙන් සිදුවන අලාභය හෝ හානිය.
16. අභිරහස් අතුරුදහන් වීමක් හෝ පැහැදිළි කළ නොහැකි අලාභයක් හේතුවෙන් සිදුවන අලාභය හෝ හානිය.

**දේපල ව්‍යතිරේක**

පහත සඳහන් කාරණා හේතුවෙන් සෘජුව හෝ වක්‍රව ඇතිවන භෞතික අලාභ හෝ භෞතික හානි මෙම රක්ෂණය මගින් ආවරණය නොවේ:

1. ඉඩම් හෝ ඉඩමේ වටිනාකම්
2. රක්ෂිතයාගේ පරිශ්‍රයේ නොමැති බල සම්ප්‍රේෂණය, පෝෂක මාර්ග හෝ නල මාර්ග
3. දේපල එහි සාමාන්‍ය මෙහෙයුම් වලදී හිස්ව තබා ගැනීමට අදහස් කරන්නේ නම් මිස, එහි අඩංගු ඕනෑම ගොඩනැගිල්ලක් හෝ ව්‍යුහයක් හෝ දේපලක්, එම ගොඩනැගිල්ල හෝ ව්‍යුහය දින තිහකට වඩා හිස්ව හෝ අක්‍රියව පවතින අතරතුර
4. ගුවන් යානා හෝ වෙනත් ඕනෑම ගුවන් උපකරණයක් හෝ ජල යාත්‍රාවක්
5. වාහන, දුම්රිය එන්ජින් හෝ රෝලින් ස්ටොක් ඇතුලු ඕනෑම ඉඩම් ප්‍රවාහනයක්, එවැනි ඉඩම් ප්‍රවාහනය මෙහි ප්‍රකාශයට පත් කර නොමැති නම් සහ හානිය සිදුවන අවස්ථාවේ මෙහි රක්ෂණය කර ඇති දේපලෙහි පිහිටා ඇති විට පමණි.
6. සියලු වර්ගවල සතුන් ශාක සහ ජීවීන්
7. රක්ෂිතයාගේ පරිශ්‍රයේ නොමැති මාර්ගස්ථ දේපල.

*(කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 03 සහ 04 "බැහැර කර ඇති අලාභ" කොටස බලන්න)*

**ව්‍යාපාර ඇණහිටීම් යටතේ ව්‍යතිරේක**

මෙම දිගුව යටතේ පහත සඳහන් දෑ ආවරණය නොකෙරේ:-

1. වැඩවර්ජකයින් හෝ වෙනත් පුද්ගලයින් විසින් රක්ෂිත පරිශ්‍රයට ඇතුලු වීමේ ප්‍රතිඵලයක් නිසා දේපල නැවත ගොඩනැගීමේදී, අලුත්වැඩියා කිරීමේදී හෝ ප්‍රතිස්ථාපනය කිරීමේදී හෝ මෙහෙයුම් නැවත ආරම්භ කිරීමේදී හෝ අඛණ්ඩව පවත්වාගෙන යාමේදී අලාභය වැඩි වීම;
2. රක්ෂණය කර ඇති ව්‍යාපාර ඇණහිටීමේ සෘජු ප්‍රතිඵලයක් නිසා ඇති වී තිබුණහොත් මිස, කිසියම් කල්බදුවක්, බලපත්‍රයක්, කොන්ත්‍රාත්තුවක් හෝ නියෝගයක් අත්හිටුවීම, කල්ඉකුත් වීම හෝ අවලංගු කිරීම නිසා අලාභය වැඩි වීම. එවැනි අවස්ථාවකදී ප්‍රාරක්ෂකයන් විසින් වගකිම භාරගනු ලබන්නේ, මෙම ඔප්පුව යටතේ ආවරණය කර ඇති හානිපූරණ කාලසීමාවේ දී රක්ෂිතයාගේ ඉපැයීම් වලට සිදුවන අලාභය දක්වා පමණි;
3. මෙහි රක්ෂණය කර ඇති ඕනෑම දේපලක භාවිතය, ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියා කිරීම හෝ කඩා දැමීම නියාමනය කරන ඕනෑම ආඥා පනතක් හෝ නීතියක් බලාත්මක කිරීම නිසා සිදුවන පාඩු නැඩි වීම;
4. වෙළෙඳපොල අහිමිවීම හෝ වෙනත් ඕනෑම අනුෂංගික අලාභයක්.

**<u>වාරික ගෙවීමේ ක්‍රමය:</u>**

ඔප්පුව සඳහා වාරිකය සහ ඉන් අනතුරුව කෙරෙන අලුත් කිරීමකදී (ඔප්පු උපලේඛනයේ වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති නම්) වාර්ෂිකව ගෙවිය යුතුය.

**<u>හිමිකම් ක්‍රියා පටිපාටිය සහ අවශ්‍ය ලියකියවිලි:</u>**

මෙම ඔප්පුව යටතේ හිමිකම් පෑමකට තුඩු දිය හැකි ඕනෑම සිදුවීමක් පිළිබඳව රක්ෂණ සමාගමට වහාම දැනුම් දිය යුතුය.

1. අලාභය/හානිය පිළිබඳව ඔබ දැනගත් වහාම 011-2206306 යන අංකය ඔස්සේ අප අමතන්න.
2. නීතියෙන් නියම කර ඇති පරිදි (සොරකමක්, ද්වේෂසහගත හානියක්, කැරළි කෝලාහල සහ වැඩවර්ජන, ගිනි තැබීම් හෝ සැකසහිත ගිනි තැබීමකදී වැනි) සිද්ධිය පිළිබඳව ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කරන්න.
3. තෙවන පාර්ශවයක් විසින් කිසියම් හිමිකම් පෑමක් සිදු කරන්නේ නම්, කිසිම පොරොන්දුවක් ඔවුනට ලබා නොදී එය අප වෙත යොමු කරන්න.
4. මෝටර් රථවාහන නොවන හිමිකම් දෙපාර්තමේන්තුව විසින් එවනු ලබන හිමිකම් පෝරමය පුරවා ඔබගේ හිමිකම් ගෙවීම වේගවත් කිරීම සඳහා ඉල්ලා සිටින අනෙකුත් ලියකියවිලි සමග එය හැකි ඉක්මණින් ආපසු එවන්න.
5. දේපල පිළිබඳ හිමිකම් පෑමක් නම්, හානිවූ දේපල නිරීක්ෂණය කිරීම සඳහා තක්සේරුකරුවෙක් හෝ විමර්ශන නිලධාරියෙක් හැකි ඉක්මණින් යවනු ලැබේ.
6. අලාභය/හානිය තක්සේරු කිරීම අලාභයේ ස්වභාවය අනුව සුදුසු අලාභ තක්සේරුකරුවෙක් විසින් සිදු කරනු ලැබේ.

**අවශ්‍ය ලියකියවිලි:**

- නිසිපරිදි සම්පූර්ණ කරල ලද හිමිකම් පෝරමය
- පොලීසියට කරන ලද පැමිණිල්ලේ පිටපතක්, අදාළ වන්නේ නම්
- ඇස්තමේන්තු සහ බිල්පත්
- හිමිකම තක්සේරු කිරීමේදී රක්ෂණ සමාගමට අවශ්‍ය විය හැකි වෙනත් ඕනෑම අවශ්‍යතා

**<u>වංචාව:</u>**

රක්ෂිතයා විසින් හෝ ඔහු වෙනුවෙන් කරන ලද කිසියම් හිමිකම් පෑමක් කිසියම් ආකාරයකින් පදනම් විරහිත, වංචනික හෝ හිතාමතාම අතිශයෝක්තියෙන් දක්වා ඇත්නම්, හෝ එයට සහාය දැක්වීම සඳහා ව්‍යාජ ප්‍රකාශයක් කර ඇත්නම්, මේ යටතේ කිසිදු හිමිකම්පෑමක් අයකරගත නොහැකි වනු ඇත.

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 08, "වංචනික හැසිරීම සහ වැරදි තොරතුරු සැපයීම" කොටස බලන්න*

**<u>ඔප්පු හිමියාගේ වගකීම්:</u>**

**වැදගත් තොරතුරු හෙළිදරව් කිරීම පිළිබඳව ඔප්පු හිමියාගේ වගකීම්**

- මිලදී ගන්නා අවස්ථාවේදී:- ඕනෑම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමක් වළක්වා ගැනීම සඳහා යෝජනාපත්‍රයේ ඉල්ලා ඇති සියලුම වැදගත් කරුණු සත්‍ය හා නිවැරදිව හෙළි කරන්න.

- ඔප්පු කාලසීමාවේදී:- අවදානම් හෝ පුද්ගලික තොරතුරුවල සිදුවන සැලකිය යුතු වෙනස්කම් පිළිබඳව රක්ෂණ සමාගමට දැනුම් දෙන්න.

**හිමිකම් පෑමක් කරන විට ඔප්පු හිමියාගේ වගකීම්**

- හිමිකම් පෑමක් කරන විට:- හිමිකම් පෝරමය සමග හිමිකම් ක්‍රියා පටිපාටියේ සඳහන් කර ඇති පරිදි අවශ්‍ය සියලුම ලියකියවිලි සහ විස්තර සපයන්න.

**<u>පැමිණිලි පිළිබඳ ක්‍රියා පටිපාටිය:</u>**

අපි ඔබට සේවය කිරීමට කැපවී සිටින අතර ඔබගේ අදහස්/යෝජනා ලබාගැනීමට කැමැත්තෙන් සිටින්නෙමු. අපගේ සේවාවන් පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ
නම්, ඔබට පහත ක්‍රම මගින් පැමිණිල්ලක් ඉදිරිපත් කල හැකිය:

- දුරකතනයෙන් - පාරිභෝගික සේවා නිලධාරි - 011 2126136
- ඊ-මේල් මගින් - pilassist@peoplesinsurance.lk
- වට්ස්ඇප් මගින් - 0716230048
- ෆැක්ස් මගින් - 011 2126109
- තැපැලෙන් - පාරිභෝගික සේවා නිලධාරි, පීපල්ස් ඉන්ෂුවරන්ස් පී.එල්.සී., අංක 07, හැව්ලොක් පාර, කොළඹ 05
- මාර්ගගත ක්‍රමය මගින් - පැමිණිලි ඉදිරිපත් කිරීමේ පෝරමය අපගේ වෙබ් අඩවියෙන් www.peoplesinsurance.lk ලබාගත හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න
- අපගේ ප්‍රධාන කාර්යාලය වෙත පැමිණීමෙන්

පැමිණිල්ලක ඉදිරිපත් කරන අවස්ථාවේදී පහත සඳහන් තොරතුරු ලබා දිය යුතුය:-

i. පැමිණිල්ල කෙටියෙන්
ii. ඔබගේ නම සහ ඔබ හා සම්බන්ධ විය හැකි තොරතුරු
iii. යොමුව: ඔප්පු අංකය / හිමිකම් අංකය
iv. සනාථ කෙරෙන ඕනෑම ලියවිලි

පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටිය භාෂා ත්‍රිත්වයෙන්ම අපගේ www.peoplesinsurance.lk වෙබ් අඩවියෙන් භාගත කල හැකිය. කරුණාකර "පැමිණිලි" ටැබ් එක මත ක්ලික් කරන්න

**<u>ආරවුල් විසඳීම:</u>**

ඉදිරිපත් කරන ලද පැමිණිල්ලක් සඳහා අප විසින් ලබා දී ඇති විසඳුම පිළිබඳව ඔබ සෑහීමකට පත් නොවන්නේ නම්, පහත සඳහන් විකල්ප ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් භාවිතා කිරීමට ඔබට හැකියාවක් ඇත:

i. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:-

ශ්‍රී ලංකා රක්ෂණ ඔම්බුඩ්ස්මන්
අංක: 1, බෙතෙස්ඩා පෙදෙස,
කොළඹ 05
info@insuranceombudsman.lk
011 2505542 / 011 250 5041

ii. බේරුම්කරණය:- ඔප්පුවේ බේරුම්කරණ වගන්තියට අනුව

iii. ඔබගේ ගැටළු පහත ලිපිනයට යොමු කරන්න:- අධ්‍යක්ෂ විමර්ශන
ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
11 වෙනි මහල, නැගෙනහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01
011 2396184-9 / 011 2335167
investigation@ircsl.gov.lk / info@ircsl.gov.lk

*කරුණාකර ඔප්පුවෙහි පිටු අංක 15, ''ආරවුල් විසඳීම'' යන කොටස බලන්න*

**මතක තබා ගත යුතු කරුණු කිහිපයක්**

**රක්ෂණය අවලංගු කිරීම:**

රක්ෂිතයාගේ ඉල්ලීම පරිදි මෙම රක්ෂණය ඕනෑම අවස්ථාවක අවසන් කල හැකි අතර, එවැනි අවස්ථාවකදී කිසිදු හිමිකම් පෑමක් කර නොතිබීමට යටත්ව, රක්ෂණ සමාගම විසින් ඔප්පුව ක්‍රියාත්මකව පැවති කාලය සඳහා සාමාන්‍ය කෙටි කාලීන අනුපාතයක් රඳවා ගනු ඇත. රක්ෂිතයාට දැනුම් දීමෙන් පසු රක්ෂණ සමාගමේ කැමැත්ත පරිදි ඕනෑම අවස්ථාවක මෙම රක්ෂණය අවලංගු කල හැකි අතර, එවැනි අවස්ථාවකදී අවලංගු කිරීමේ දින සිට කල් ඉකුත් නොවූ කාලය සඳහා ඉල්ලා සිටි විට වාරිකයෙන් සමානුපාතික කොටසක් ආපසු ගෙවීමට රක්ෂණ සමාගම බැඳී සිටී.

මෙම ඔප්පුවේ නියමයන් සහ කොන්දේසි නිසි ලෙස පිලිපැදීම සහ ඉටු කිරීම, මෙම ඔප්පුව යටතේ ඕනෑම ගෙවීමක් කිරීමේ රක්ෂණ සමාගමෙහි වගකීමට පූර්ව කොන්දේසියක් වනු ඇත.

**වැදගත් සටහන්:**

රක්ෂණ සැලසුම් පිළිබඳ තොරතුරු ලේඛනය (IPID) හි අරමුණ වන්නේ මූලික ආවරණය සහ අමතර ආවරණවල (අදාල වේ නම්) සහ ඔප්පුවේ ප්‍රධාන ලක්ෂණ පිළිබඳ සාරාංශයක් ලබා දීම වන අතර එය ඔබගේ නිශ්චිත පුද්ගලික අවශ්‍යතාවන් සඳහා සකස් කරන ලද්දක් නොවන බව සලකන්න. මෙම රක්ෂණයට අදාල ඕනෑම ආකාරයක සියලු කාරණා (හිමිකම් පෑම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ අර්ථකථන සහ නීතිමය කටයුතු වැනි එහෙත් ඒවාට පමණක් සීමා නොවූ) මෙම ලේඛනයෙහි අන්තර්ගතය අභිබවා බලපැවැත්වෙන මූලික රක්ෂණ ඔප්පුවේ ඉංග්‍රීසි මුද්‍රණයේ නියමයන්, කොන්දේසි සහ ව්‍යතිරේක මගින් පාලනය වන බව කරුණාවෙන් සලකන්න.

**වැඩිදුර තොරතුරු සඳහා:**

ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පහත සඳහන් මාර්ග ඔස්සේ එය ලබා ගත හැකිය:

- දුරකතනය - 0112126126
- ඊ-මේල් - pilassist@peoplesinsurance.lk
- දිවයින පුරා පිහිටි අපගේ ශාඛා කාර්යාලයන් වෙත පැමිණීමෙන්